# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1550/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 10/12/2023 පැය 0950

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ**

**01. 2023.12.09 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | - | 140 | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු සහ දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. බලපත්‍ර නොමැතිව අනවසර පතල් කැණීමක් සිදු කළ පුද්ගලයින් තිදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2023.12.09 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පස්සර පොලිස් වසමේ ගොයිදමුල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව පතල් කැණීම් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනකු හා පතල් කැණීමේ ස්ථානයක් පවත්වාගෙන ගිය පුද්ගලයෙකු** අත්අඩංගුවට ගෙන වැඩි දුර විමර්ශන සඳහා බදුල්ල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28ත් 45ත් අතර වයස් වල පසුවන පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**03. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2023.12.09 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මරිච්චිකට්ටි රක්ෂිතයේ කල්ලාරු ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථ පහකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු** අත්අඩංගුවට ගෙන සිලාවතුර අධවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22ත් 47ත් අතර වයස් වල පසු වන මර්ච්චිකට්ටි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ .**

## 04. නීති විරෝධී මත් කරල් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.

2023.12.09 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ ශ්‍රී ජයා බැස්ටියන් පල්ලිය පාර අසල වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්කරල් 250ක් සහ යතුරු පැදියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23ත් 26ත් අතර වයස් වල පසු වන යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැඩිදුර විමර්ශන යාපනය පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**